# 12. ගමන් බිමන්

## ක්‍රියාකාරකම 1

- පහත සඳහන් ක්‍රියාකාරකම් කිරිමට යොමු කරන්න.

1. දෑත් ඉදිරියට දිගු කර තනි පාදයෙන් මඳ වේලාවක් සිටින්න.



2. පාදය මාරු කරමින් දෑත් ඉදිරියට දිගු කර තනි පාදයෙන් මඳ වේලාවක් සිටීම.



- මෙසේ සිටීමේදී සමබරතාව නොමැති වුවහොත් ඔබට කුමක් සිදුවේද?

.....................................................................................................................
.....................................................................................................................
.....................................................................................................................

- අප සිදු කරන ක්‍රියාකාරකමට අදාළ පින්තූරය සොයා යා කරන්න.



දිවීම



ගසකට නැගීම



පඩිපෙළක් නැගීම



ළිඳෙන් වතුර ඇදීම



අතුගෑම

# ක්‍රියාකාරකම 2

- බර එසවීම හා ඒවා රැගෙන යන ආකාරය සොයා යා කරන්න.



බරක් කොන්දේ තබා ගෙන යෑම



වතුර කළයක් ඉණෙහි තබා ගෙන යෑම



කදක් කර තබා ගෙන යෑම



උදැල්ලක් කර තබා ගෙන යෑම



යම් බරක් හිස මත තබා ගෙන යෑම

- ඉහත දක්වා ඇති අවස්ථා අභිරූපණයෙන් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.
- වැරදි එසවීම් හා ගෙන යෑම් හේතුවෙන් ශරිරයට විය හැකි ආබාධ ලියන්න.

..........................................................................................................................

..........................................................................................................................

...............................................................................................................

## ක්‍රියාකාරකම 3

- අප ගමන් බිමන් සඳහා භාවිත කරන වාහන පොදු හා පෞද්ගලික ලෙස වර්ග කළ හැක. පහත වගුව තුළ √ ලකුණ යොදමින් ඒවා වර්ග කරන්න.

| වාහනය | පෞද්ගලික | පොදු |
|---|---|---|
| බස් රථය | | |
| ලොරි රථය | | |
| මෝටර් රථය | | |
| බයිසිකල් | | |
| දුම්රිය | | |
| වෑන් රථය | | |
| ගුවන් යානය | | |
| නැව | | |
| ත්‍රීරෝද රථය | | |
| මෝටර් සයිකලය | | |
| ටිපර් රථය | | |

- වැඩිහිටි අයෙකු සමඟ පාර අසලට යන්න. ඔබ දුටු පොදු වාහන අඳින්න. පාට කරන්න.

- පෞද්ගලික  වාහන අඳින්න. පාට කරන්න.

- බස් රථයක ගමන් කරන ආකාරය රඟ දක්වන්න. එහි දී පහත දැක්වෙන කරුණු පිළිබඳව සැළකිලිමත් වන්න.

  - ➢ පේළියට ගොස් බසයට නැගීම.
  - ➢ නියමිත ගාස්තුව ගෙවා ටිකට්පත් ලබා ගැනීම.
  - ➢ අන් අයට හිරිහැර නොකිරීම.
  - ➢ වාහනය අපවිත්‍ර නොකිරීම. (තමන් ආහාරයට ගත්පසු ඉතිරි කොටස් තම බෑගයට දමා ගැනීම.)
  - ➢ බසය තුළ සෙල්ලම් නොකිරීම.
  - ➢ වාහනයේ ගමන් කිරිමේදී ජනේලයෙන් හිස හා අත් ආදිය පිටතට නොදැමීම.

- පහත දී ඇති වැකි නිවැරදි නම් √ ලකුණ ද වැරදි නම් × ලකුණ ද කොටුව තුළ යොදන්න.

01. පොදු වාහන සුරැකීම අප සතු යුතුකමකි. ☐
02. දුම්රිය හා බසය පොදු වාහන වලට අයත්ය. ☐
03. යම් කාලසටහනකට අනුව ධාවනය වන වාහන පුද්ගලික වාහන වේ. ☐
04. ගාස්තුවක් අය නොකර මගීන් ගෙන යන්නේ පොදු වාහන වලය. ☐
05. පොදු වාහන නතර කිරිම සඳහා නිශ්චිත ස්ථාන තිබේ. ☐

## ක්‍රියාකාරකම 04

- ගමන් බිමන් යෑමේදී විය හැකි අනතුරු හා අපහසුතා කිහිපයක් පහත දැක් වේ. ඒවා හොඳින් කියවන්න.

01. බස්රථයක් නොමැති වීම හේතුවෙන් ගමන ප්‍රමාද වීම.
02. මාර්ගය ගං වතුරින් යට වී තිබීම.
03. මාර්ගයේ සතුන් (අලින් ,හරකුන් ,බල්ලන් ) සිටීම.
04. බෝතල් කටු වැනි දේ වලට පාදය කැපී යාම.
05. බල්ලෙකු හපා කෑම.

- අනතුරු හා අපහසුතා වලින් වැළකී සිටිමට ගත හැකි පියවර කිහිපයක් පහත දැක් වේ. ඒවා හොඳින් කියවන්න.

  01. කල් වේලා ඇතිව ගමන පිටත් වීම.
  02. මාර්ගයේ ගමන් කරන විට වැඩිහිටියන් සමග ගමන් කිරීම.
  03. පාරේ ගමන් කරන විට දකුණු පසින් ගමන් කිරිම.
  04. ආරක්ෂිතව වාහන වල ගමන් කිරිම.
  05. පාවහන් පැළඳ ගමන් කිරිම.

- ඉහත සඳහන් කර ඇති අනතුරු හා අපහසුතාත් එයින් වැළකීමට ගත හැකි පියවරත් පත්‍රිකාවල වෙන වෙනම ලියා පෙට්ටි දෙකකට දමන්න.

  ➢ ඩිමයි කොළයක් ගෙන දෙකට නවා එක් පැත්තක අනතුරු හා අපහසුතාද අනෙක් පැත්තේ ඒවා වළක්වා ගැනීමට ගත හැකි පියවර ද ලෙස ලියන්න.
  ➢ පෙට්ටි වලින් එක් එක් පත්‍රිකාව රැගෙන ඒවා ඩිමයි කොළයේ අදාළ පැත්තේ ඇලවීමට යොමු කරන්න.

## ක්‍රියාකාරකම 5

- තමා කැමති වාහනයක ආකෘතියක් මැටි/ කාඩ්බෝඩ්/ ක්ලේ/ ලී කුට්ටි ආදී වශයෙන් කැමති ද්‍රව්‍යයක් යොදා ගෙන නිර්මාණය කරන්න.